ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2003 අංක 2 දරන රේගු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 ජනවාරි මස 6 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2003 ජනවාරි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 13.50 යි. තැපැල් ගාස්තුව : රු. 6.75 යි.

2003 අංක 2 දරන රේගු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කලේ 2003 ජනවාරි මස 6 වන දින.]

එල්. ඩී.–ඕ. 10/2002

රේගු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය.

1. මේ පනත 2003 අංක 2 දරන රේගු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

235 වන අධිකාරයේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) රේගු ආඥාපනතේ 51 වන වගන්තියේ "ආනයනකරු හෝ ඔහුගේ අනුයෝජිතයා විසින් ප්‍රකාශයක් මගින්" යන වචන වෙනුවට "ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ප්‍රමාණයක හා වර්ණයෙන් යුතු ආකෘති පත්‍රයක, ආනයනකරු හෝ ඔහුගේ අනුයෝජිතයා විසින් කරනු ලබන ප්‍රකාශයක් මගින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 51අ, 51 ආ සහ 51 ඇ යන වගන්ති ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා එම ප්‍රඥප්තියේ 51අ, 51ආ හා 51ඇ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :–

"නිලධරයකුට සැකයක් ඇති වූ විට, ඔහුට වැඩිදුර තොරතුරු කැඳවිය හැකි බව.

51අ. (1) (අ) ඇතුළුවීමේ බිල්පත්‍රයක හෝ 51 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයක හෝ 47 වන වගන්තිය යටතේ වූ ඇතුළුවීමේ බිල්පත්‍රයක් සනාථ කිරීම සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලද ලේඛනවල ඇති යම් තොරතුරක සත්‍යභාවය හෝ නිවැරදි භාවය පිළිබඳව සැක කිරීමට රේගු නිලධරයකුට හේතු ඇති අවස්ථාවක, "ඉ" උපලේඛනයේ 8 වන ව්‍යවස්ථාව අනුව වෙනස් කළ හැකි වූ ද ආනයනය කරන ලද භාණ්ඩ සඳහා ඇත්ත වශයෙන් ගෙවන ලද හෝ ගෙවීමට ඇති මුළු මුදල, ප්‍රකාශ කරන ලද රේගු අගය නියෝජනය කරන බව ඔප්පු කිරීම සඳහා වූ ලේඛනගත හෝ වෙනත් සාක්ෂි ඇතුළුව වෙනත් තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඒ රේගු නිලධාරි විසින් ආනයනකරුට හෝ ඔහුගේ අනුයෝජිතයාට හෝ භාණ්ඩ ආනයනය කිරීමට අදාළ වෙනත් යම් පාර්ශ්වයකට නියම කරනු ලැබිය හැකි ය.

(ආ) යම් තොරතුරක් ලැබීමෙන් පසු හෝ යම් ප්‍රතිචාරයක් නොමැති විට දී, ප්‍රකාශිත රේගු අගයෙහි සත්‍යතාවය හෝ නිවැරදිභාවය පිළිබඳව රේගු නිලධරයාට තවදුරටත් සාධාරණ සැකයක් ඇත්නම්, "ඉ" උපලේඛනයේ 1 වන ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ප්‍රශ්නයට තුඩු දී ඇති ආනයනය කරන ලද භාණ්ඩවල රේගු අගය නිශ්චය කළ නොහැකි බවට සලකනු ලබන අතර ආනයනකරු ඉල්ලා සිටියහොත් ඒ සැකයට හේතු පිළිබඳව ඔහු වෙත ලිඛිතව නිලධරයා විසින් දැනුම් දෙනු ලැබිය යුතු අතර කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ද ඔහුට ලබාදිය යුතු ය.

(ඇ) ඉන්පසු "ඉ" උපලේඛනයේ වෙනත් විධිවිධාන වලට අනුකූලව රේගු අගය නිශ්චය කිරීම සඳහා රේගු නිලධරයා කටයුතු කළ යුතු අතර උචිත පරිදි අගය සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(2) "ඉ" උපලේඛනයේ යම් ව්‍යවස්ථාවක් යටතේ ආනයනකරු හෝ ඔහුගේ අනුයෝජිතයා විසින ප්‍රකාශයට පත් කරන ලද මුලින් භාරගනු ලැබූ අගය උචිත නොවන බව, පරීක්ෂණයක හෝ විමර්ශනයක හෝ 128 අ වගන්තිය යටතේ පවත්වන ලද විගණනයක ප්‍රතිඵලයක් වශයෙන්, භාණ්ඩ නිදහස් කිරීමට පෙර හෝ පසුව යම් අවස්ථාවක රේගු නිලධරයකු සෑහීමට පත් වන්නේ නම්, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් "ඉ" උපලේඛනයේ උචිත ව්‍යවස්ථාවට අනුකූලව අගය සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(3) මේ ආඥාපනතේ කාර්ය සඳහා රේගු අගය (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ සංශෝධිත අගය විය යුතු ය.

(4) ආනයනකරු විසින් ලිඛිත ඉල්ලීමක් කළ විට, ආනයනකරුගේ බඩුවල රේගු අගය (2) වන උපවගන්තිය යටතේ නිශ්චය කරන ලද ආකාරය පිළිබඳව ලිඛිතව පැහැදිලි කිරීමක් ලබා දිය යුතු ය.

(5) බඩු රේගු පාලනයෙන් නිදහස් කරනු ලැබුව ද එසේ නැති වුවද නැතහොත් එම බඩු මත තක්සේරු කරන ලද යම් බද්දක් ගෙවනු ලැබුව ද එසේ නැති වුවද (2) වන උපවගන්තිය ඒ බඩු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ නිලධරයකුගේ තීරණයකින් අසෘප්තියට පත් යම් ආනයනකරුවකු විසින් ඒ දැන්වීම තමා වෙත ලැබී දින දහයක් ඇතුළත ඒ තීරණයට එරෙහිව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අභියාචනය කළ හැකි ය. ආනයනය කරන ලද බඩු ආනයනකරු වෙත නිදහස් කරනු ලැබුව ද එසේ නැති වුවද සහ රේගු බද්දෙන් යම් කොටසක් ගෙවා ඇති වුවද එසේ නැති වුවද අභියාචනය කිරීමේ අයිතිය, ඒ ආනයනකරුට තිබිය යුතු ය. අභියාචනය පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය සහ එවැනි තීරණයක් සඳහා වූ හේතු ලිඛිතව දැක්විය යුතු ය.

(7) තම අභියාචනය පිළිබඳව තීරණය විභාග වෙමින් පවතිද්දී, බඩු නිදහස් කර ගැනීමට ආනයනකරු අදහස් කරන අවස්ථාවක, වංචාවක් පිළිබඳව සැක කරනු ලබන අවස්ථාවක දී හැර, බඩු යටත් වන්නේ යම් රේගු බදු සහ වෙනත් බදු ගෙවීම සඳහා ද ඒ රේගු බදු හා වෙනත් බදු ගෙවීම සඳහා ඇප ඉදිරිපත් කිරීම මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බඩු නිදහස් කිරීමට අවසර දෙනු ලැබිය හැකි ය.

ආනයනකරු විසින් වාර්තා අවුරුදු තුනක් තබාගත යුතු බව.

51. ආ (1) සෑම ආනයනකරුවකු, අනුයෝජිතයකු හෝ ආනයනයික බඩු ආනයනය කිරීමට, ප්‍රවාහනය කිරීමට සහ ගබඩා කිරීමට අදාළ වෙනත් තැනැත්තන් විසින්, ආනයනය කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා, නියම කරනු ලැබිය හැකි වාර්තා ශ්‍රී ලංකාව තුළ තබා ගත යුතු ය ; නැතහොත් එවැනි වාර්තා තැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) එවැනි සෑම තැනැත්තකු විසින්ම රේගු නිලධරයකු විසින් නියම කරනු ලැබූ කවර හෝ අවස්ථාවක –

(අ) වාර්තා ඒ නිලධරයාට ලබා දිය යුතු ය ;

(ආ) නියම කරනු ලබන පරිදි, වාර්තාවල පිටපත් ලබා දිය යුතු ය ; සහ

(ඇ) ආඥාපනත යටතේ පැන නගින කරුණු වලට අදාළ යම් ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතු ය.

රහස්‍ය භාවය නදින්ම පවත්වාගෙන යා යුතු බව.

51ඇ. රේගු තක්සේරු කිරීම්වල කාර්ය සඳහා රහස්‍ය ස්වභාවයේ හෝ රහසේ සපයනු ලබන සියලු තොරතුරු, රේගු නිලධරයා විසින් එසේ සලකනු ලැබිය යුතු අතර, ඒ තොරතුරු සපයන තැනැත්තාගේ හෝ රජයේ ලිඛිත අවසරය නොමැතිව, අධිකරණමය කටයුත්තක දී හෙළි කිරීමට නියම කරනු ලැබිය හැකි ප්‍රමාණය හැර, හෙළි නොකළ යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ ''52 වන වගන්තියෙහි ''ඉ'' උපලේඛනයේ විධිවිධානවලට අනුකූල නොවන බවය'' යන වචන වෙනුවට ''51 වන වගන්තියට අනුව එය අසත්‍ය ප්‍රකාශයක් නම්'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 52අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. 52 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 52අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :-

''වාර්තා තැබීම පැහැර හැරීම, විනාශ කිරීම හෝ වෙනස් කිරීම ආදිය සඳහා දඩය.

52අ. මේ ආඥාපනතේ විධිවිධාන උල්ලංඝනය කරමින්, 51ආ වගන්තිය යටතේ තැබීමට නියමිත වාර්තා තැබීම පැහැර හරින හෝ මේ ආඥාපනත යටතේ තැබීමට නියමිත යම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ ලේඛනයක් විනාශ කරන, වෙනස් කරන හෝ සඟවන නැතහොත් එවැනි යම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ ලේඛනයක් ශ්‍රී ලංකාවෙන් පිටතට යවන හෝ යැවීමට උත්සාහ කරන සෑම තැනැත්තෙක්ම වරදක් සිදුකරන අතර රුපියල් පන්ලක්ෂයකට නොවැඩි දඩයකට යටත්විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි –

(අ) ''ඒ'' ඡේදයෙහි ''කිරීම සඳහා ; සහ'' යන වචන වෙනුවට'' කිරීම සඳහා'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "උ" ඡේදයේ "නියම කිරීම සඳහා" යන වචන වෙනුවට "නියම කිරීම සඳහා" ; සහ යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) "උ" ඡේදය අවසානයට පසු පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ඌ) 51 වන වගන්තිය යටතේ රේගු කාර්ය සඳහා අගය තක්සේරු කිරීම සඳහා.".

ප්‍රධාන ප්‍රඥප්තියට 128අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 128අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :–

"විගණනය කිරීමේ හෝ වාර්තා පරීක්ෂා කිරීමේ කාර්ය සඳහා ඇතුළු වීමේ බලය.

128අ. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව තන්කාර්ය සඳහා බලය පවරනු ලැබූ රේගුවේ යම් නිලධරයකුට –

(අ) දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ යම් සාධාරණ වේලාවක් තුළ දී, 51ආ වගන්තියට අනුකූලව වාර්තා තබා ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළු වී, විශේෂ ගණුදෙනු පිළිබඳව හෝ ඒ වාර්තා සාදා ඇති හෝ ගබඩා කර ඇති, එහිත් ක්‍රියා කරන හෝ විද්‍යුත් ක්‍රම වල ප්‍රමාණවත් භාවය හෝ විශ්වසනීයත්වය පිළිබඳව යම් කරුණක් මත ඒ වාර්තා විගණනය කිරීම හෝ පරීක්ෂා කිරීම කළ හැකි ය ;

(ආ) මේ ආඥාපනතේ ඉහතින්ම වූ විධිවිධානවල කාර්ය සඳහා යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලේඛනයක් තිබිය හැකි යම් භාජනයක් විවෘත කොට පරීක්ෂා කළ හැකි ය ;

(ඇ) ඒ ස්ථානයේ හෝ ගොඩනැගිල්ලේ තිබී හමුවූ යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක්, හෝ වෙනත් ලේඛනයක් පරීක්ෂා කොට ඒවායේ පිටපත් ගැනීම හෝ උධෘත ගැනීම කළ හැකි ය ;

(ඇ) යම් ගොඩනැගිල්ලක තිබී හමුවූ යම් පරිගණකයක් ක්‍රියා කරවා එහි වාර්තා කර ඇති හෝ ගබඩා කර ඇති යම් සටහන්වල සම්පූර්ණ පිටපත් හෝ ඒවායින කොටසක පිටපත් ලබාගත හැකිය, නැතහොත් සම්පූර්ණ මුද්‍රිත පිටපත් හෝ ඒවායින් කොටසක මුද්‍රිත පිටපත් ලබා ගත හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින්, යම් තැනැත්තකුගෙන් යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් තමා සන්තකයට ගත් අවස්ථාවක, ඒ නිලධරයා විසින් තම සන්තකයට ගත් පොත, රෙජිස්ටරය, වාර්තාව හෝ ලේඛනය සඳහන් කරමින් ඒ තැනැත්තා වෙත ලියවිල්ලක් නිකුත් කළ යුතු ය.

(3) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තමා සන්තකයට ගත් යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක්,වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් ඒ පොත, රෙජිස්ටරය, වාර්තාව හෝ ලේඛනය පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, රෙජිස්ටරය, වාර්තාව හෝ වෙනත් ලේඛනය අයත් තැනැත්තාට එරෙහිව නීත්‍යනුකූලව කටයුතු කිරීම සඳහා ඒ පොත, රෙජිස්ටරය, වාර්තාව හෝ වෙනත් ලේඛනය තමා සන්තකයෙහි රඳවා ගත හැකි ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ රේගුවේ යම් බලයලත් නිලධරයකුට යම් ගොඩනැගිල්ලකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම සඳහා ආධාර කරන ලෙස, ඒ ගොඩනැගිල්ල හෝ ස්ථානය භාරව සිටින හෝ ඒ ගොඩනැගිල්ලේ හෝ ස්ථානයේ පදිංචිව සිටින යම් තැනැත්තකුගෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඒ බලයලත් රේගු නිලධරයා විසින් ඉල්ලා සිටිය හැකි අතර එසේ ඉල්ලා සිටි විට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඒ නිලධරයාට ආධාර කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හැරියහොත් ඔහු වරදකට වරදකරු වන්නේ ය.

(5) මේ වගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ යම් රේගු නිලධරයකුට බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඔහුට බාධා කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේ ය.

(6) (4) වන හෝ (5) වන උපවගන්ති යටතේ වූ යම් වරදකට වරදකරු වන යම් තැනැත්තෙක් රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තියේ "රේගු කාර්යාලය" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ලේඛනය" යන්නට, විද්‍යුත් වාර්තාවක හෝ මුද්‍රිත කඩදාසියක ගබඩා කර ඇති, වාර්තා කර ඇති හෝ දෘෂ්‍ය හෝ කාන්දම් මාධ්‍යයක පිටපත් කර ඇති වූ ද කවර හෝ ආකාරයකින් ලබාගත හැකි වූ ද යම් තොරතුරක් ද ඇතුළත් වේ ;".

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ "ඉ" උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියට "ඉ" උපලේඛනය ආදේශ කිරීම.

එසේ වුවද උපලේඛනය ඉවත් කිරීම නොතකා, ඉවත් කළ උපලේඛනය යටතේ විභාග කළ සහ අලුත් උපලේඛනය ක්‍රියාත්මක වූ දිනයට පෙරාතුව වූ දිනයේ දී විභාග වෙමින් පැවති සියලු නඩු සහ නිති කෘතීන්

(අ) අවස්ථාවෝචිත පරිදි ඉවත් කරන ලද උපලේඛනය යටතේ යථා පරිදි විභාග කරනු ලැබ ඇති ලෙස හෝ විභාග කිරීමට ඇති ලෙස සලකනු ලැබිය යුතු ය ; සහ

(ආ) ඉවත් කරන ලද උපලේඛනය ඉවත් නොකළ ලෙස සලකා එම උපලේඛනය යටතේ විභාග කරනු ලැබිය හැකි ය : නැතහොත් දිගටම පවත්වාගෙන යා හැකි ය.

උපලේඛනය - "ඊ"

රේගු වටිනාකම නියම කිරීමේ රීති

1. වන ව්‍යවස්ථාව

1. ආනයනය කරනු ලබන භාණ්ඩ වල රේගු වටිනාකම විය යුත්තේ ගනුදෙනු කිරීමේ වටිනාකමයි. එනම්, ශ්‍රී ලංකාවට අපනයනය කිරීම සඳහා භාණ්ඩ විකුණනු ලැබූ අවස්ථාවේ දී 8 වන ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුව ගලපනු ලැබූ සත්‍ය වශයෙන් ම ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු මිල වේ.

එසේ වුවද,

(අ) (i) නීතිය මගින් හෝ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අධිකාරීන් විසින් පනවනු ලබන හෝ නියම කරනු ලබන්නා වූ ද :

(ii) භාණ්ඩ නැවත විකිණිය යුතු භූගෝලීය ප්‍රදේශ සීමා කරන්නා වූ ද : හෝ

(iii) භාණ්ඩවල වටිනාකම කෙරෙහි සැලකිය යුතු ලෙස බල නොපාන්නා වූ ද,

සීමා කිරීම හැර, ගැනුම්කරු විසින් භාණ්ඩ බැහැර කිරීම හෝ භාවිත කිරීම් සම්බන්ධයෙන් වූ සීමා කිරීම් නොතිබිය යුතුය.

(ආ) භාණ්ඩවල වටිනාකම නියම කිරීමේ දී වටිනාකමක් නිශ්චය කළ නොහැකි යම් කොන්දේසියකට හෝ ප්‍රතිෂ්ඨාපනයකට යටත් නොවූ විකිණීමක් හෝ විකුණුම් මිලක් ඇතිවිට ද,

(ඇ) 8 වන ව්‍යවස්ථාව යටතේ නිසි ගැලපීමක් කළ නොහැකි නම්, ගැනුම්කරු විසින් කරනු ලබන යම් පශ්චාත් නැවත විකිණීමක බැහැර කිරීමක් හෝ භාණ්ඩ භාවිත කිරීමක් මගින් ලැබෙන මුදලෙන් කොටසක් කෙළින් ම හෝ වක්‍රව විකුණුම්කරුට උපචය නො වන විට ද,

(ඇ) ගැනුම්කරු හා විකුණුම්කරු අතර සම්බන්ධයක් නොමැති විට දී, හෝ ගැනුම්කරු හා විකුණුම්කරු අතර සම්බන්ධයක් ඇති විට දී, 2 වන ඡේදයේ විධිවිධාන යටතේ රේගු කටයුතු සඳහා ගනුදෙනු කිරීමේ වටිනාකම පිළිගත හැකිවන විට ද,

අදාළ නොවේ.

2. (අ) 1වන ඡේදයේ කාර්යයන් සඳහා ගනුදෙනු කිරීමේ වටිනාකම පිළිගැනීම නිශ්චය කිරීමේ දී, මෙම උපලේඛනයේ 9 වන ව්‍යවස්ථාවේ අර්ථය තුළ ගැනුම්කරු හා විකුණුම්කරු අතර සම්බන්ධයක් ඇතැයි යන කරුණ පමණක් ගනුදෙනු කිරීමේ වටිනාකම නොපිළිගැනීම සඳහා හේතුවක් නොවිය යුතු ය. එවැනි අවස්ථාවක දී, විකිණීමට සම්බන්ධ පරිවේෂණික වටපිටාව පරීක්ෂා කළ යුතු අතර, සම්බන්ධතාව මිල කෙරෙහි බලපෑමක් කර නොමැති නම් ගනුදෙනු කිරීමේ වටිනාකම පිළිගත යුතු ය. ආනයනකරු විසින් හෝ අන්‍යාකාරයකින් ලබාදුන තොරතුරු අනුව මිල කෙරෙහි සම්බන්ධතාව බලපෑමක් සිදුකර ඇතැයි සැලකීමට රේගු පරිපාලනයට හේතු ඇතිවිට, එකී හේතු ආනයනකරුට දැන්විය යුතු අතර ම, ප්‍රතිචාර දැක්වීමට ආනයනකරුට සෑහෙන අවස්ථාවක් ලබාදිය යුතු ය. ආනයනකරු ඉල්ලා සිටින්නේ නම් එම හේතු දැක්වීම ලිඛිතව සිදු කළ යුතු ය.

(ආ) ඒ අවස්ථාවේ දී ම හෝ ඊට ආසන්නයේ දී, සිදුවන පහත දැක්වෙන එකකට, ආනයනකරු විසින් දක්වනු ලබන ගනුදෙනු කිරීමේ වටිනාකම ආසන්න වන අවස්ථාවක දී සම්බන්ධතාවක් ඇති නැතැත්තන් අතර වූ විකිණීම්වල දී එකී වටිනාකම පිළිගත යුතු අතර 1 වන ඡේදයේ විධිවිධානවලට අනුව භාණ්ඩවල වටිනාකම නියම කළ යුතු ය.

(i) ශ්‍රී ලංකාවට අපනයනය කිරීමට ඇති සම්බන්ධතාවක් නොමැති ගැනුම්කරුවන්ගේ අනන්‍ය හෝ සමාන භාණ්ඩ ගනුදෙනු කිරීමේ වටිනාකම ;

(ii) 5 වන ව්‍යවස්ථාව යටතේ අනන්‍ය හෝ සමාන භාණ්ඩවල රේගු වටිනාකම නිශ්චය කරනු ලැබීම ;

(iii) 6 වන ව්‍යවස්ථාව යටතේ අනන්‍ය හෝ සමාන භාණ්ඩවල රේගු වටිනාකම නිශ්චය කරනු ලැබීම.

ඉහත සඳහන් පරීක්ෂණ අදාළ කිරීමේ දී, වාණිජ මට්ටම, ප්‍රමාණයේ මට්ටම, 8 වන ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලධර්ම හා විකුණුම්කරු හා ගැණුම්කරු අතර සම්බන්ධයක් නොමැති විකිණීම්වල දී විකුණුම්කරු විසින් කරනු ලැබූ වියදම් ද විකුණුම්කරු හා ගැණුම්කරු අතර සම්බන්ධයක් ඇතිවිට විකුණුම්කරු විසින් දරනු නොලැබූ වියදම් පිළිබඳ ව ප්‍රදර්ශිත වෙනස්කම්වල ඇති කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් දැක්විය යුතු ය.

(ඇ) 2 (ආ) ඡේදයෙහි දැක්වෙන පරීක්ෂණ භාවිත කළ යුත්තේ ආනයනකරුගේ ඉල්ලීම පරිදි සංසන්දනය කිරීමේ කාර්යය සඳහා පමණි. 2(ආ) ඡේද යටතේ ආදේශිත වටිනාකම ස්ථාපනය කළ නොහැකි ය.

2 වන ව්‍යවස්ථාව

1. (අ) 1 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව ආනයනය කළ භාණ්ඩවල රේගු වටිනාකම නිශ්චය කළ නො හැකි විට, රේගු වටිනාකම විය යුත්තේ ශ්‍රී ලංකාවට අපනයනය කිරීම සඳහා විකුණනු ලැබූ අනන්‍ය භාණ්ඩ අපනයනය කරනු ලැබූ අවස්ථාවේ හෝ ඊට ආසන්නයේ දී භාණ්ඩවල වටිනාකම නියම කිරීමට අනුව වූ ගනුදෙනු කිරීමේ වටිනාකම වේ.

(ආ) මෙම ව්‍යවස්ථාව අදාළකර ගැනීමේ දී, එම වාණිජ මට්ටමේ ම වූ ද, භාණ්ඩවල වටිනාකම නියම කිරීමේ දී හරවන් ප්‍රමාණයේ ම වූ අනන්‍ය භාණ්ඩ විකිණීමක ගනුදෙනු කිරීමේ වටිනාකම රේගු වටිනාකම නිශ්චය කිරීමේ දී, භාවිත කළ යුතු ය. එවැනි විකිණීමක් නොමැති විටක දී, වෙනස් වාණිජ මට්ටමක වූ සහ වෙනස් ප්‍රමාණයක වූ අනන්‍ය භාණ්ඩ විකිණීමක දී වූ ගනුදෙනු කිරීමේ වටිනාකම වාණිජ මට්ටම හෝ ප්‍රමාණයන්ට අනුව විශේෂ වන වෙනස්කම් සලකා බලා ගලපනු ලැබීමෙන් පසු දෙකෙන් එකක් භාවිත කළ යුතු වූ ද, එවැනි ගැලපීමක් කළ හැක්කේ වටිනාකම වැඩිවීමක් හෝ අඩුවීමක වන නමුත්, ගැලපීමේ සාධාරණත්වය හා සත්‍යභාවය ඉදිරිපත් කර ඇති සාක්ෂි මත පැහැදිලිව සාධනය වන විට දී ය.

2. 8 වන ව්‍යවස්ථාවේ 2 වන ඡේදයේ සඳහන් වියදම් හා ගාස්තු ගනුදෙනු කිරීමේ වටිනාකමට ඇතුළත් කර ඇති විට, ප්‍රවාහනය කිරීමේ දුර ප්‍රමාණයන් ගේ හා ක්‍රමයන් ගේ වෙනස්කම් හේතුකොටගෙන පැන නගින ආනයනය කරන ලබන භාණ්ඩ සහ අනන්‍ය භාණ්ඩ අතර වූ වියදම් හා ගාස්තුවල කැපී පෙනෙන වෙනස්කම් සැලකිල්ලට ගනිමින් ගැලපීමක් කළ යුතු ය.

3. මෙම වගන්තිය අදාළ කර ගැනීමේ දී අනන්‍ය භාණ්ඩවල ගනුදෙනු කිරීමේ වටිනාකම් කිහිපයක් දක්නට ඇති විට, ආනයනය කරනු ලැබූ භාණ්ඩවල රේගු වටිනාකම් නිශ්චය කිරීම සඳහා එම අඩුම වටිනාකම භාවිත කළ යුතු ය.

3 වන ව්‍යවස්ථාව

1. (අ) 1 වන හා 2 වන ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ ආනයනය කරන ලැබූ භාණ්ඩවල රේගු වටිනාකම නිශ්චය කළ නොහැකි නම්, භාණ්ඩවල වටිනාකම නියම කරන කාලයේ දී හෝ ඊට ආසන්න කාලයේ දී ශ්‍රී ලංකාවට අපනයනය කරනු ලැබූ සමාන භාණ්ඩවල වටිනාකම රේගු වටිනාකම විය යුතු ය.

(ආ) මෙම ව්‍යවස්ථාව අදාළ කර ගැනීමේ දී, එම වාණිජ මට්ටමේ ම වූ ද, භාණ්ඩවල වටිනාකම නියම කිරීමේ දී හරවන් ප්‍රමාණයේ ම වූ සමාන භාණ්ඩ විකිණීමක ගනුදෙනු කිරීමේ වටිනාකම රේගු වටිනාකම නිශ්චය කිරීමේ දී භාවිත කළ යුතු ය. එවැනි විකිණීමක් නොමැති විටක දී, වෙනස් වාණිජ මට්ටමක ව සහ වෙනස් ප්‍රමාණයේ වූ සමාන භාණ්ඩ විකිණීමක දී වූ ගනුදෙනු කිරීමේ වටිනාකම් වාණිජ මට්ටමට සහ ප්‍රමාණයන්ට අනුව විශේෂිතවන වෙනස්කම් සලකා බලා ගලපනු ලැබීමෙන් පසු දෙකෙන් එකක් භාවිත කළ යුතු වූ ද, එවැනි ගැලපීමක් කළ හැක්කේ, වටිනාකම වැඩිවීමක් හෝ අඩුවීමක් වන නමුත් එම ගැලපීමේ සාධාරණත්වය හා සත්‍යභාව ඉදිරිපත් කර ඇති සාක්ෂි මත පැහැදිලිව සාධනය වන විට දී ය.

2. 8 වන ව්‍යවස්ථාවේ 2 වන ඡේදයේ සඳහන් වියදම් හා ගාස්තු ගනුදෙනු කිරීමේ වටිනාකමට ඇතුළත් කර ඇති විට, ප්‍රවාහනය කිරීමේ දුර ප්‍රමාණයන් ගේ හා ක්‍රමයන්ගේ වෙනස්කම් හේතුකොටගෙන පැන නගින ආනයනය කරන ලැබූ භාණ්ඩ හා අනන්‍ය භාණ්ඩ අතර වූ වියදම් හා ගාස්තුවල කැපී පෙනෙන වෙනස්කම් සැලකිල්ලට ගනිමින් ගැලපීමක් කළ යුතු ය.

3. මෙම ව්‍යවස්ථාව අදාළ කර ගැනීමේ දී සමාන භාණ්ඩවල ගනුදෙනු කිරීමේ වටිනාකම් කිහිපයක් දක්නට ඇති විට දී, ආනනයනය කරන ලැබූ භාණ්ඩවල රේගු වටිනාකම් නිශ්චය කිරීම සඳහා එම අඩුම වටිනාකම භාවිත කළ යුතු ය.

4 වන ව්‍යවස්ථාව

1 වන, 2 වන හා 3 වන ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ ආනයනය කරනු ලැබූ භාණ්ඩවල වටිනාකම නිශ්චය කල නොහැකි නම්, ආනයනකරුගේ ඉල්ලීම පරිදි 5 වන හා 6 වන ව්‍යවස්ථා ඇදාළ කිරීමේ නියෝගය ප්‍රතිගමනය කරනු ලැබූ අවස්ථාවන්හි දී හැර, 5 වන ව්‍යවස්ථාවෙහි විධිවිධාන යටතේ රේගු වටිනාකම නිශ්චය කළ යුතු අතර, එම ව්‍යවස්ථාව යටතේ රේගු වටිනාකම නිශ්චය කළ නොහැකි නම් 6 වන ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ එය කළ යුතු ය.

5 වන ව්‍යවස්ථාව

1. (අ) ආනයනය කරනු ලැබූ භාණ්ඩ හෝ අනන්‍ය භාණ්ඩ හෝ ආනයනය කරනු ලැබූ සමාන භාණ්ඩ ආනයනය කරනු ලැබූ තත්වයෙන් ම ශ්‍රී ලංකාවේ දී විකුණනු ලබන්නේ නම්, මෙම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව ආනයනය කරනු ලැබූ භාණ්ඩවල රේගු වටිනාකම සඳහා පාදක විය යුත්තේ පහත දැක්වෙන අඩු කිරීම්වලට යටත්ව භාණ්ඩ අපනයනය කිරීමේ වටිනාකම තක්සේරු කරනු ලබන කාලයේ හෝ ඊට ආසන්න කාලයේ දී එම භාණ්ඩ විකුණන තැනැත්තන් හා සම්බන්ධයක් නොමැති භාණ්ඩ මිලයට ගන්නා තැනැත්තන්ට විකුණනු ලැබූ ආනයනය කරනු ලැබූ භාණ්ඩවල හෝ අනන්‍ය හෝ ආනයනය කරනු ලැබූ සමාන භාණ්ඩවල ඉහළම ප්‍රමාණයේ ඒකකයෙහි ඒකකයක මිලය.

(i) සුපුරුදු පරිදි ගෙවනු ලැබූ හෝ ගෙවීමට එකඟ වූ හෝ එම පංතියේ හා වර්ගයේ ආනයනය කරනු ලැබූ භාණ්ඩ ශ්‍රී ලංකාවේ දී විකිණීමේ දී, ලාභ හා සාමාන්‍ය වියදම් වශයෙන් සුපුරුදු පරිදි කළ එකතු කිරීම ;

(ii) ප්‍රවාහනය හා රක්ෂණය වෙනුවෙන් වූ සාමාන්‍ය වියදම් හා ඒ ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ දී දරන ලද වියදම් ;

(iii) 8 වන ව්‍යවස්ථාවේ 2 වන ඡේදයේ සඳහන් කර ඇති නියමිත වියදම් හා ගාස්තු ; ද

(iv) ආනයනය කිරීම හෝ භාණ්ඩ විකිණීමේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ දී ගෙවිය යුතු රේගු ගාස්තු හා වෙනත් ජාතික බදු ද වේ.

(ආ) භාණ්ඩ ආනයනය කිරීමේ වටිනාකම තක්සේරු කරනු ලබන කාලයේ හෝ ඊට ආසන්න කාලයේ දී ආනයනය කරනු ලැබූ භාණ්ඩ හෝ අනන්‍ය භාණ්ඩ හෝ ආනයනය කරනු ලැබූ සමාන භාණ්ඩ විකිණීමක් කරනු නොලැබුවේ නම් රේගු වටිනාකම අන්‍යාකාරයකින් 1 (අ) ඡේදයේ විධිවිධානවලට යටත් විය යුතු අතර, ඒ සඳහා පාදක විය යුත්තේ භාණ්ඩ ආනයනයේ වටිනාකම තක්සේරු කළ දිනයෙන් පසුව ඊළඟ එන කලින් දිනයේ කරනු ලැබූ විකිණීමක දී, එහෙත් එකී ආනයනය කිරීමේ දින සිට දින අනූවක් ගතවීමට පෙර, ආනයනය කරනු ලැබූ භාණ්ඩ හෝ අනන්‍ය හෝ ආනයනය කරනු ලැබූ සමාන භාණ්ඩ, ආනයනය කරනු ලැබූ තත්වයෙන් ම ශ්‍රී ලංකාවේ දී විකුණනු ලැබූ ඒකකයක මිල ය.

2. ආනයනය කරනු ලැබූ භාණ්ඩ හෝ අනන්‍ය භාණ්ඩ හෝ ආනයනය කරනු ලැබූ සමාන භාණ්ඩ ආනයනය කරනු ලැබූ තත්ත්වයෙන් ම ශ්‍රී ලංකාවේ දී විකුණනු ලබන්නේ නම්, එවිට ආනයනකරු එසේ ඉල්ලා සිටින්නේ නම්, රේගු වටිනාකම සඳහා පාදක විය යුත්තේ, ආනයනය කරන ලැබූ භාණ්ඩ පැමිණුම් පිළිගැනීමෙන් පසුව එම භාණ්ඩ ශ්‍රී ලංකාවේ දී මිලයට ගන්නා තැනැත්තන් හා විකුණුම්කරුවන් අතර සම්බන්ධයක් නැතිව විකිණීමේ දී, එකී සැකසුම සඳහා වූ එකතු කිරීම් හා 1 (අ) ඡේදයේ දක්වා ඇති අඩු කිරීම් සඳහා හිමි වාසි ලබාදීමෙන් පසුව වන ඒකකයක මිල ය.

6 වන ව්‍යවස්ථාව

1. මෙම ව්‍යවස්ථාවෙහි විධිවිධාන යටතේ ආගණිතය කරනු ලැබූ භාණ්ඩවල වටිනාකම ආනයනය කරනු ලැබූ වටිනාකම මත පාදක විය යුතු ය. ආගණිතය කරනු ලැබූ වටිනාකම වනුයේ -

(අ) ආනයනය කරනු ලැබූ භාණ්ඩ උත්පාදනය සඳහා යොදා ද්‍රව්‍ය සහ එකලස් කිරීමේ හෝ වෙනත් සැකසුම් ක්‍රියාවන් සඳහා වූ වියදම් හෝ වටිනාකම් :

(ආ) ශ්‍රී ලංකාවට ආනයනය කිරීම සඳහා අපනයනය කරන රටෙහි නිෂ්පාදකයන් විසින් සාදනු ලැබූ භාණ්ඩ වල වටිනාකම නියම කරනු ලබන අවස්ථාවේ එම පන්තියේ හා වර්ගයේ භාණ්ඩ විකිණීමේ දී පුරුදු පරිදි එක් කරනු ලබන ලාභ හා පොදු වියදම් සඳහා වූ මුදල් ප්‍රමාණයන් :

(ඇ) 8 වන ව්‍යවස්ථාවේ 2 ඡේදයේ දැක්වෙන පරිදි සියලු වෙනත් වියදම් හෝ වටිනාකම් ය.

2. ආගණිතය කරනු ලැබූ වටිනාකම නිශ්චය කරනු සඳහා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලෙස හෝ යම් ගිණුම් හෝ වෙනත් වර්ග වලට ප්‍රවේශය ලබාදෙන ලෙස රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකාවේ පදිංචිකරු නොවන තැනැත්තකු ගෙන් ඉල්ලා සිටීම හෝ බල කිරීම කළ නොහැකි ය. කෙසේ වෙතත්, මෙම විධිවිධාන යටතේ රේගු වටිනාකම නිශ්චය කිරීම සඳහා භාණ්ඩ නිෂ්පාදකයා විසින් සපයනු ලැබූ තොරතුරු, නිෂ්පාදකයා ගේ එකඟතාවය ඇතිව සහ අදාළ රටේ රජයට කල් ඇතිව කරනු ලැබූ ප්‍රමාණවත් දැනුම්දීමකින් පසු එම රටෙන් පරීක්ෂණය පිළිබඳව විරෝධයක් නොමැති නම්, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනෙක් රටේ දී සත්‍යායනයක් කළ හැකි ය.

7 වන ව්‍යවස්ථාව

1. ආනයනය කරනු ලැබූ භාණ්ඩවල රේගු වටිනාකම 1 - 6 දක්වා වූ ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ නිශ්චය කළ නො හැකි නම්, 1994 බදු සහ වෙළෙඳාම පිළිබඳ පොදු ගිවිසුමේ VII වන ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේ විධිවිධානවලට අනුකූල සාධාරණ ක්‍රම භාවිත කිරීමෙන් රේගු වටිනාකම නිශ්චය කළ යුතු ය.

2. (අ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලැබූ භාණ්ඩ ශ්‍රී ලංකාවේ දී විකුණනු ලබන මිලක් ;

(ආ) රේගු කටයුතු සඳහා විකල්ප වටිනාකම් දෙකින් ඉහළ වටිනාකම පිළිගැනීමට විධිවිධාන සලස්වන ක්‍රමයක් :

(ඇ) ආනයනය කරනු ලබන රටෙහි දේශීය වෙළෙඳපොළේ භාණ්ඩ විකුණනු ලබන මිලක් :

(ඈ) 6 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව අනන්‍ය හෝ සමාන භාණ්ඩ සඳහා නිශ්චය කරනු ලැබූ ආගණනය කළ වටිනාකමට අන්‍ය වූ නිෂ්පාදන වියදමක් :

(ඉ) ශ්‍රී ලංකාව හැර වෙනත් රටකට අපනයනය කරනු ලබන භාණ්ඩවල මිලක් :

(ඊ) අවම රේගු වටිනාකම ; හෝ

(උ) අත්තනෝමතික හෝ ව්‍යාජ මිලක් :

පදනම් කර ගෙන මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ රේගු වටිනාකම නිශ්චය කළ නො හැක.

3. ආනයනකරු විසින් ඉල්ලා සිටින්නේ නම්, මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව නිශ්චය කරනු ලැබූ රේගු වටිනාකම සහ එකී වටිනාකම නිශ්චය කරනු ලැබූ ක්‍රමය ආනයනකරු වෙත ලිඛිතව දැක්විය යුතු ය.

8 වන ව්‍යවස්ථාව

1. 1 වන ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ රේගු වටිනාකම නිශ්චය කිරීමේ දී ආනයනය කරනු ලැබූ භාණ්ඩවලට සත්‍ය වශයෙන් ම ගෙවනු ලැබූ මිලට හෝ ගෙවිය යුතු මිලට පහත සඳහන් දෑ එකතු කළ යුතු ය.

(අ) පහත දැක්වෙන පරිදි ගැණුම්කරු විසින් යම්තාක් දුරට වියදම් දරනු ලැබූ නමුදු, භාණ්ඩවලට සත්‍ය වශයෙන් ගෙවූ මිලට හෝ ගෙවිය යුතු මිලට ඇතුළත් කරනු නොලැබූ-

(i) මිලයට ගැනීමේ කොමිස් මුදල් හැර, කොමිස් හා තැරැව්කාර ගාස්තු ;

(ii) අදාළ භාණ්ඩ සමග ඇති රේගු කාර්යයන් සඳහා යැයි සලකනු ලබන බහාලු අසුරනවල මිල

(iii) කම්කරු හෝ ද්‍රව්‍ය සඳහා වූ ඇසුරුම් පිරිවැය.

(ආ) භාණ්ඩවලට සත්‍ය වශයෙන් ම ගෙවූ මිලට හෝ ගෙවිය යුතු මිලට ඇතුළත් කරනු නොලැබූ තාක් දුරට, ආනයනය කරනු ලැබූ භාණ්ඩ අපනයනය කිරීම සඳහා නිෂ්පාදනය සහ විකිණීම සම්බන්ධයෙන් භාවිත කිරීමට නොමිලයේ හෝ අඩු මිලයට විකුණුම්කරු විසින් කෙළින් ම හෝ වක්‍රාකාරයෙන් සපයනු ලැබූ පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සඳහා යෝග්‍ය ලෙස වෙන් කරනු ලැබූ වටිනාකම :

(i) ආනයනය කරනු ලැබූ භාණ්ඩවලට ඇතුළත් කළ ද්‍රව්‍යයන්, සහභාගයන්, කොටස් හා සමාන අයිතමයන් ;

(ii) ආනයනය කරනු ලැබූ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලැබූ උපකරණ, අච්චු, කෝටු හා සමාන අයිතමයන් ;

(iii) ආනයනය කරනු ලැබූ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා යොදාගන්නා ද්‍රව්‍යයන් ;

(iv) ආනයනය කරනු ලැබූ භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වූ ආනයනය කරනු ලැබූ රටේ දී හැර වෙනත් තැනක දී භාවිත කරනු ලැබූ ඉංජිනේරු, ශිල්පීය, සංවර්ධන කාර්ය, චිත්‍ර වැඩ මෝස්තර, වැඩ, සැලසුම් සහ දළ සටහන්.

(ඇ) සත්‍ය වශයෙන් ම ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු මිලට ඇතුළත් කරනු නො ලැබූ, භාණ්ඩවල වටිනාකම තක්සේරු කිරීම සම්බන්ධයෙන් අදාළ වූ ගැනුම්කරු විසින් කෙළින් ම හෝ වක්‍රාකාරයෙන් ගෙවිය යුතු වූ රාජ්‍ය භාගයන් හා බලපත්‍ර ගාස්තු වූ ද, විකිණීම සඳහා භාණ්ඩවල වටිනාකම නියම කිරීමේ දී කොන්දේසියක් වශයෙන් ඇතුළත් වන තාක් දුරට එකී රාජ්‍ය භාගයන් හා බලපත්‍ර ගාස්තු ;

(ඈ) විකුණුම්කරුට කෙළින් ම හෝ වක්‍රාකාරයෙන් උපචය වන්නා වූ ආනයනය කරනු ලැබූ භාණ්ඩවල යම් නැවත විකිණීමක දී, බැහැර කිරීමක දී හෝ භාවිතයට ගැනීමක දී ලැබෙන ඉපැයීමේ වටිනාකම හෝ එකී යම් කොටසක්.

(ඉ) පහත සඳහන් පිරිවැය :-

(i) වරායට ආනයනය කරනු ලැබූ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ පිරිවැය ;

(ii) වරායට ආනයනය කරනු ලැබූ භාණ්ඩ ප්‍රවාහනයට අදාළ වූ පැටවීමේ, බෑමේ සහ මෙහෙයුම් ගාස්තු ; සහ

(iii) රක්ෂණ වියදම්.

2. මෙම ව්‍යවස්ථාව යටතේ සත්‍ය වශයෙන් ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු මිලට එකතු කළ හැක්කේ විෂයානුබද්ධ හා ප්‍රමාණීකරණ පදනමක් මත පමණි.

3. මෙම ව්‍යවස්ථාවෙන් විධිවිධාන සලසා ඇති පරිදි හැර රේගු වටිනාකම නිර්ණය කිරීම සඳහා සත්‍ය වශයෙන් ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු මිලට එකතු කිරීමක් නොකළ යුතු ය.

9 වන ව්‍යවස්ථාව

ප්‍රලේඛනයෙහි, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

-

"ආනයනය කරනු ලැබූ භාණ්ඩවල රේගු වටිනාකම" යන්නෙන් ආනයනය කරනු ලැබූ භාණ්ඩවල වටිනාකම අනුව බදු අයකර ගැනීමේ කාර්යය සඳහා වූ භාණ්ඩවල වටිනාකම අදහස් කෙරේ ;

"ශ්‍රී ලංකාව" යන්නට ශ්‍රී ලංකාවේ රේගු දේශ භූමිය ඇතුළත් වේ ;

"නිෂ්පාදනය කරනු ලැබ" යන්නෙන් වගා කරනු ලැබූ, නිෂ්පාදනය කරනු ලැබූ හෝ කණිනු ලැබූ ආදිය ඇතුළත් වේ.

"අනන්‍ය භාණ්ඩ" යන්නෙන් භෞතික ලක්ෂණ, ගුණාත්මක භාවය හා කීර්ති නාමය අනුව හැම ආකාරයෙන් එක සමාන වූ භාණ්ඩ අදහස් කෙරේ. අන්‍යාකාරයෙන් අර්ථ නිරූපණයට අනුකූලවන්නා වූ භාණ්ඩවල පෙනුමට ඇති සුළු වෙනස්කම් නිසා අනන්‍ය ලෙස සැලකීමෙන් නොවැළැක් වේ ;

"සමාන භාණ්ඩ" යන්නෙන් සියලු ආකාරයෙන් ම එක සමාන නො වුව ද, සමාන ලක්ෂණ හා සමාන සහභාගී ද්‍රව්‍යයන් සහිත වූ එමගින් එම කාර්යයන් ම කළ හැකි වූ වාණිජමය වශයෙන් මාරු කළ හැකි භාණ්ඩ අදහස් කෙරේ ;

"අනන්‍ය භාණ්ඩ" සහ "සමාන භාණ්ඩ" යන පාඨයන් හි, අවස්ථෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ දී සිදු කරන ලද බැවින් 8 වන ව්‍යවස්ථාවේ 1 (ආ) (iv) ඡේදය යටතේ ගැලපීමක් කරනු නොලැබූ ඉංජිනේරු ශිල්පීය, සංවර්ධනාත්මක, චිත්‍ර කටයුතු, මෝස්තර කටයුතු හා සැලසුම් ද දළ සටහන් ද ඇතුළත් වූ හෝ පිළිබිඹු වන්නා වූ භාණ්ඩ ඇතුළත් නොවේ ;

භාණ්ඩවල වටිනාකම තක්සේරු කිරීමේ දී එකම රටේ දී නිෂ්පාදනය කර නොමැති නම් "අනන්‍ය භාණ්ඩ" හෝ "සමාන භාණ්ඩ" වශයෙන් භාණ්ඩ හඳුනා ගැනීම නොකළ යුතු ය :

භාණ්ඩවල වටිනාකම තක්සේරු කිරීමේ දී, අනන්‍ය භාණ්ඩ හෝ සමාන භාණ්ඩ නොමැති විට, අවස්ථාවෝචිත පරිදි, විවිධ තැනැත්තන් විසින් නිෂ්පාදනය කරනු ලැබූ භාණ්ඩ එකම තැනැත්තකු විසින් නිෂ්පාදනය කරනු ලැබූ භාණ්ඩ ලෙස සැලකිය හැකි ය.

"සමාන පන්තියේ හා වර්ගයේ භාණ්ඩ" යන්නෙන් විශේෂ කර්මාන්තයක් හෝ කර්මාන්ත අංශයක් මගින් නිෂ්පාදනය කරනු ලැබූ එක් සමූහයකට හෝ පරාසයකට ඇතුළත් භාණ්ඩ අදහස් කරනු අතර අනන්‍ය හෝ සමාන භාණ්ඩ ද එහි ඇතුළත් වේ.

යම් තැනැත්තන් එකිනෙකාට සම්බන්ධ ලෙස සැලකිය යුත්තේ–

(අ) ඔවුන් එකිනෙකා ගේ ව්‍යාපාරයන්හි නිලධරයන් හෝ අධ්‍යක්ෂවරුන් වන විට :

(ආ) ඔවුන් ව්‍යාපාරයක හවුල්කරුවන් ලෙස නීත්‍යානුකූලව පිළිගෙන ඇති විට :

(ඇ) ඔවුන් සේවායෝජකයා හා සේවා නියුක්තයන් වන විට :

(ඈ) යම් තැනැත්තෙක් කෙළින්ම හෝ වක්‍රාකාරයෙන් දෙදෙනා ගේ ම පරිශේෂ ඡන්දය දීමේ ස්කන්ධයෙන් හෝ කොටස් වලින් සියයට 5ක් හෝ ඊට වැඩියෙන් අයිතිකර ගෙන, පාලනය කර ගෙන හෝ දරා සිටින විට :

(ඉ) ඔවුන් එකිනෙකා විසින් අනෙකා කෙළින් ම හෝ වක්‍රාකාරයෙන් පාලනය කරන විට :

(ඊ) ඔවුන් දෙදෙනා ම කෙළින් ම හෝ වක්‍රාකාරයෙන් තුන්වන තැනැත්තකු විසින් පාලනය කරනු ලබන විට :

(උ) ඔවුන් දෙදෙනා ම එකතුව කෙළින් ම හෝ වක්‍රාකාරයෙන් තුන් වන තැනැත්තකු පාලනය කරන විට : හෝ

(ඌ) ඔවුන් එකම පවුලේ සාමාජිකයන් වන විට දි පමණි.

එකම අනුයෝජිතයා, එකම බෙදාහරින්නා හෝ එකම පැවරුම් ලාභී ලැබුම්කරුවා ලෙස ව්‍යාපාරික කටයුතු ආශ්‍රිතව එකිනෙකාට සම්බන්ධකම් ඇති තැනැත්තන් ඉහත උපමාන තුළට වැටෙන්නේ නම්, ඔවුන් විසින් අනෙකා කවරාකාරයකින් විස්තර කර තිබුණ ද, මෙම උපලේඛනයේ කාර්යයන් සඳහා සම්බන්ධතාවන් ඇති ලෙස සැලකිය යුතු ය.

10 වන ව්‍යවස්ථාව

මේ උපලේඛනයේ ප්‍රතිපාදන කෙසේ වෙතත්, ජාතික ආර්ථිකයේ යහපත පිණිස හෝ වෙනත් හේතුවක් නිසා, ඇමතිවරයා විසින්, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන නියෝගයකින්, එකී නියෝගයේ විශේෂිතව සඳහන් කළ කාලයකට ඕනෑම භාණ්ඩයක් සඳහා අවම වටිනාකමක් නියම කළ හැකි අතර එකී අවම අගයන් මත එකී භාණ්ඩවල බදු අය කළ යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන වක් වන් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.